www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද වාඩිලා ගැනීම මිලියන 3.7ක ඉරාකීයයන් සරනාගතයින් බවට හරවයි

## US occupation turns 3.7 million Iraqis into refugees

**ජේම්ස් කොගෑන් විසිනි**
**2007 ජනවාරි 23**

එක්සත් ජනපදයේ ඉරාක ආක්‍රමනය සහ වාඩිලා ගැනීම හේතුවෙන් සෑම ඉරාකීයයන් අට දෙනෙකුගෙන් එක් අයෙකුටම - මිලියන 3.7කට වැඩි ප්‍රමානයකට - ඔවුන්ගේ වාසස්ථානයන් වෙතින් පලා යාමට බල කෙරී ඇති බව එක්සත් ජාතීන්ගේ සරනාගතයන් පිලිබඳ ආයතනය (UNHCR) මේ මාසයේදී වාර්තා කලේය. එම ආයතනය පෙන්වා දී ඇත්තේ ඉරාක යුද්ධය හේතුවෙන් ඇතිවූ සරනාගත අර්බුදය 1948 දී ඊශ්‍රායලය බිහි කිරීමත් සමග සිදු වූ වාර්ගික ශුද්ධයට පසුව මැද පෙරදිග කලාපයේ ඇතිවූ දරුනුතම තත්වය ලෙසයි. තක්සේරු වාර්තාවන්ට අනුව සයොනිස්ට් මිලිටරි සහ පැරාමිලිටරි ඝාතන කල්ලි විසින් 711,000ක් පලස්තීනු අරාබි ජාතිකයන් ඔවුන්ගේ වාසභූමි වෙතින් පලවා හරිනු ලැබ ඇත.

2003ට පෙර රටින් පිටව ගිය, නමුත් රටේ විපත්ති දායක තත්වය හේතුවෙන් නැවත පැමිනීමට නොහැකි වූවන්ද ඇතුලත්ව මිලියන දෙකක් ඉරාක ජනතාව දැන් රටින් පිටත ජීවත් වන බව UNHCR තක්සේරු කරන්නේය. 2005දී විදේශ ගත වූ ඉරාකීයයන් 50,000ක් පමන නැවත පැමිනි මුත් පසුගිය වසරේ නැවත පැමින ඇත්තේ දහසක පමන ප්‍රමානයක් පමනි.

තවත් ඉරාකීයයන් මිලියන 1.7ක් අවතැන්ව රට තුලම සිටිති. එක්සත් ජනපද මිලිටරියේ යටත් කර ගැනීම් වල ප්‍රතිඵලයක් ලෙස සහ පසුගිය පෙබරවාරියෙහි සමාරා හි පිහිටි ප්‍රසිද්ධ ෂියා මුස්ලිම් පල්ලියක් විනාශ කිරීමත් සමග ෂියා සහ සුන්නි මිලීෂියාවන් අතර කල්ලිවාදී සැහැසි කම් විස්මිත ලෙස ඉහල යාමේද ප්‍රතිඵලයක් ලෙස 2006දී අඩුම තරමින් 500,000ක ජනතාවක් සිය නිවෙස් හැර දා ගියහ. සෑම මාසයකදීම 80,000ත් 100,000ත් අතර ජනකායක් අභ්‍යන්තර හා විදේශයන්හි සරනාගතයන් අතරට එක් වන බව සැලකේ.

"මෙම සරනාගත අර්බුදයට හේතුව සිව් වසරකට ආසන්න එක්සත් ජනපද වාඩිලා ගැනීම් වලින් ඉරාකය තුල ඇතිවූ දේශපාලනික, සාමාජික හා ආර්ථික බිද වැටීමයි." 2006 නොවැම්බර් 1 සිට 2006 දෙසැම්බර් 1 අතරතුර කාලය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලයේ වාර්තාව මෙසේ ප්‍රකාශ කරයි: "ත්‍රස්තවාදී ක්‍රියා, අවිගත් කන්ඩායම් වල ක්‍රියා කලාපය, අපරාධ කල්ලි, ආගමික මූලධර්මවාදීන්, මිලීෂියාවන්, එසෙම ආරක්ෂක හා මිලිටරි බලකා මෙහෙයුම් වලින් සංලක්ෂිත ව පවත්නා ආරක්ෂක තත්වයේ ප්‍රධානතම ගොදුර බවට සිවිල් ජනතාව පත්ව සිටී. එහි ප්‍රතිඵලය වන අනාරක්ෂිත බව, කල්ලිවාදී අගතිය, සහ භීතිය මහජනතාවන් විසින් මූලික අයිතිවාසිකම් හා නිදහස බුක්ති විදීම කෙරෙහි නිෂේධනාත්මක හා පරිපූර්න අයුරින් බලපවත්වන්නේය. තවද, ඉහල යන විරැකියාව, දුගීබව, විවිධාකාරයේ අසමානතාවයන් සහ මූලික සේවාවන් කෙරෙහි වැඩි වැඩියෙන් සීමාන්තික වන ප්‍රවේශය බහුතරයක් පුරවැසියන් ඔවුන්ගේ ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් බුක්ති විදීමෙන් වලක්වාලන්නේය."

එක්සත් ජාතීන්ගේ සංවිධානය විශේෂයෙන්ම එක්සත් ජනපද මිලිටරියේ ක්‍රියාකාරකම් දෝෂදර්ශනයට ලක් කර ඇත: "ඉරාක-බහුජාතික බලකා (එක්සත් ජනපදය පෙරටු කොට ඉරාකය තුල සිටින වාඩිලාගත් බලකායන්ගේ නිල නාමය) මගින් සිදු කරන සන්නද්ධ මෙහෙයුම් නොකඩවාම මානව හිමිකම් බුක්ති විදීම සීමාවීමට සහ ස්වදේශික ජනතාව දරුනු පීඩාවන්ට ලක් වීමට හේතු වේ. දිගින් දිගටම සීමාවන ඔබ මොබ යාමේ නිදහස හා සෞඛ්‍ය සහ අධ්‍යාපනය වැනි මූලික සේවාවන් කරා වන සීමිත ප්‍රවේශ වීමේ හැකියාව ජනතාවගෙන් ඉහල ප්‍රතිශතයකට බලපාන අතර ඒ සමගම දිගැදුනු කාලසීමාවකට ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් අහිමි කරයි."

රට හැර යාම හැර වෙනත් විකල්පයක් නැතැයි බොහෝ ඉරාකීයයන්ට හැගී ඇත. නිවැරදි සංඛ්‍යාවන් නැතත්, 800,000ක පමන ප්‍රමානයක් සිරියාව තුල සරන ලබා ඇත; ජෝර්දානය තුල තවත් 700,000කි; ඊජිප්තුව තුල 100,000කි;

ලෙබනනය තුල 40,000ක් ද ඉරානය තුල 50,000ක් හා තුර්කිය තුල විශාල සංඛ්‍යාවක්ද සිටිති.

ඉරාක සරනාගතයන්ට කිසිදු අයිතිවාසිකමක් ලබා දී නැත. ජෝර්දාන රාජාන්ඩුව මොවුන් ලේබල් කරන්නේ "තාවකාලික අමුත්තන්" යනුවෙනි. එය ජාත්‍යන්තර සහාය ලබා ගැනීමට කිසිදු ඉල්ලීමක් කර නැති අතර UNHCR වැනි නියෝජිත ආයතන සමග සහයෝගයෙන් ක්‍රියා කරන්නේ ද නැත. ජෝර්දානයේ සිටින ඉරාකීයයන් 21,000ක් එක්සත් ජාතීන් විසින් ලියාපදිංචි කර ඇති අතර යන්තම් 800ක් දෙනා පමනක් ජාත්‍යන්තර නැවත පදිංචි කිරීම් සදහා යෝග්‍ය සරනාගතයින් බැව් හදුනාගෙන ඇත.

සිරියාවද ඔවුන්ගේ භූමිය තුල සිටින ඉරාකීයයන් සරනාගතයින් සේ පිලිගැනීමට කල ඉල්ලීම් ඉවත දමා මොවුන් සංචාරකයන් හෝ නීතිවිරෝධී සංක්‍රමනිකයන් ලෙසින් සලකයි. තවත් ඉරාකීයයන් ඇතුලු වීම වැලැක්වීම සදහා ඉරානය එහි දේශසීමා සීල් තබා ඇති අතරතුර සෞදි අරාබිය සහ කුවේටය වැනි ගල්ෆ් කලාපීය රාජ්‍යයන් ඔවුන්ගේ දේශසීමාවට ඇතුලුවීමට කොහෙත්ම ඉඩ ලබා දීම ප්‍රතික්ෂෙප කර ඇත. සරනාගතයින්ට පිහිට වීමට කිසිත් නොකරන අතරතුර, "ත්‍රස්තවාදීන්" හා "නීතිවිරෝධී සංක්‍රමනිකයන්" ඇතුලු වීම වලක්වාලීමට සෞදි අරාබිය එහි කිලෝ මීටර 1,000ක් වන සෞදි අරාබි-ඉරාක දේශසීමාවෙහි ආවරනයක් ඉදි කිරීමට ඩොලර් මිලියන 500ක් වෙන් කර ඇත. මෙම ආවරනය ආරක්ෂක දොරටු, මුරපොල සහ ඉලෙක්ට්‍රොනික චලන සංවේදී උපකරන වලින් සමන්විත වනු ඇත.

විදේශගත වූ ඉරාකීයයන්ගෙන් වැඩි ප්‍රමානයක් දැඩි සේ පීඩිතව ජීවත් වන අතර සැලකිය යුතු කොටසක් දැඩි දරිද්‍රතාවෙහි ගිලී යමින් සිටී. ජෝර්දානය එක් වසරක රක්ෂා බලපත්‍රයක් වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් 225ක්ද ඇතුලත්ව, සියලුම සේවාවන් සදහා ඉරාකීයයන්ගෙන් අය කරයි. වාර්තාවන ආකාරයට බොහෝමයක් පවුල් කුඩා නිවෙස් වල හවුලේ වාසය කරන අතර වැටුප් සහිත රැකියාවක් සොයා ගැනීමද අපහසු වී ඇත. ඔවුන්ගේ ස්වාමිපුරුෂයින් මිය යාම, අත්අඩංගුවේ පසු වීම හෝ අතුරුදහන් වීම හේතුවෙන් සියයට 10ක ටත් වඩා සිරියාවේ සිටින ඉරාක පවුල් වල ගෘහ මූලිකත්වය දරන්නේ ස්ත්‍රීන් විසිනි. ඉරාකීය සරනාගත කාන්තාවන්ට ගනිකා වෘත්තියේ නියැලීමට බල කෙරෙමින් පවතින බවට ලැබෙන වාර්තා ඉහල යමින් ඇති බැව් UNHCR මේ මසදී ප්‍රසිද්ධ කලේය.

ජෝර්දානය තුල සිටින ඉරාක සරනාගතයින් ප්‍රමානය එහි ජනගහනයෙන් සියයට 10ක ප්‍රමානයකට ඉහල ගොස් ඇත. මෙය එක්සත් ජනපදය මිලියන 30ක් සරනාගතයින් ඇතුල් කර ගැනීමකට සමාන වනු ඇත. ජෝර්දානය මත පැටවෙන මෙම ගලනයේ අධික බර, ඉරාක සරනාගතයින් කෙරෙහි පෙර නොවූ විරූ තරම් සීමාන්තික ආකල්පයක් කරා මෙහෙයවයි. බලාපොරොත්තු සුන් වූ ආගමනික සමූහය අතරෙහි ඇති දේශපාලනික නොසන්සුන් කමින් බිය වැදී, ජෝර්දානය වයස 17-35 අතර පිරිමින් ඇතුලු වීම වලක්වාලීම අරඹා ඇත්තේය. දැනටමත් ඔවුන්ගේ දේශසීමාව තුල සිටින ඉරාකීයයන්ගේ වීසා බලපත් අලුත් කිරීම ප්‍රතික්ෂෙප කරමින් රටින් නෙරපා හැරීමට පියවර ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙසින් ස්වකීය භූමිය අරක් ගත් වධහිංසාවන්ගෙන් පලා යාමට උත්සාහ දරන ඉරාකීයයන්ගේ ප්‍රමුඛතම ගමනාන්තය බවට සිරියාව පත් වී ඇත. සෑම මසකම 40,000ක් සරනාගතයින් සිරියාවට ඇතුල් වන බවට තක්සේරු කර ඇත.

පලාගිය බොහෝමයක් දෙනා ආගමිකව නොබැදුන ඉරාකීයයෝ වෙති. 2003 සිට වෘත්තීයමය මධ්‍යම පංතිකයන්ගෙන් සියයට 40ක් දෙනා රට හැර ගොස් ඇති බවට විශ්වාස කෙරේ. බොහෝමයක් දෙනා සදාම් හුසේන් □ □ බාත් පාලන තන්ත්‍රයේ තනතුරු හෙබවූවන් වන අතර එක්සත් ජනපද වාඩිලා ගැනීම විසින් අඩත්තේට්ටම් වලට ගොදුරු කර ඇත. ඒ අතරම ඔවුන් සුන්නි හා ෂියා යන ආගමික අන්තවාදීන් දෙකොටස අතරෙහිදීම මරනයට හෝ හිංසනයට මුහුන දෙති. ඉරාකයේ මෙසපොතේනියානු ක්‍රිස්තියානි සුළුතරයේ සාමාජිකයන්ද විශාල වශයෙන් රට හැර ගොස් ඇත. එක්සත් ජනපද ආක්‍රමනයේ පටන් තක්සේරු කල 750,000ක් ක්‍රිස්තියානින් පලා ගොස් තිබේ.

යුද්ධයත් එමගින් ඇතිවූ මානුෂික ව්‍යසනයත් සම්බන්දයෙන් වගකීම දරන්නවුන් වන එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍ය ආන්ඩු මෙම අර්බුදය පිළිබදව කිසිවක් කිරීම ප්‍රතික්ෂේප කර ඇත. එක්සත් ජනපදය 2003 සිට යන්තම් ඉරාක සරනාගතයින් 466 දෙනෙක් පමනක් පිළිගෙන ඇත. බ්‍රිතාන්‍ය ස්වදේශ කටයුතු කාරයාලයට අනුව, 2005 දී ඉරාකීයයන් 160 දෙනෙක් සරනාගතයින් ලෙස පිළිගෙන ඇත. තවත් 2,685ක ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කර ඇත. 2006 තුන් වැනි කාරතුවේදී, බ්ලෙයාර් ආන්ඩුව ඉරාක සරනාගතයින් 10 දෙනෙක් පමනක් පිළිගෙන ඇත්තේ 165 දෙනෙකුගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරන අතරවාරයේදී ය.

අනෙක් ප්‍රධාන යුරෝපීය බලයන්ද නොවෙනස් ය. දුෂ්ය ව්‍යවස්ථාවන් ජර්මනියට 230 දෙනෙකු පමනක් ඇතුලත් කර ගැනීමට ප්‍රවේසම් වී ඇති අතර ප්‍රංසයේ දී එය යන්තම් 13 දෙනෙකු පමනි. ස්වීඩනය සංසන්දනාත්මකව වෙනස් අයුරකින්, ඉරාකීයයන්

8,951ක ට 2006 වසරේ දී ආරක්ෂාව සලසා දී ඇත. ඔස්ට්‍රේලියානු ආන්ඩුව - ඉරාක යුද්ධයේ ප්‍රධානතම ආධාර කරුවන්ගෙන් එකෙක් - ඉරාකයෙන් පැමිනෙන සරනාගතයින් 1,834ක්, 20,000කට වැඩි ඉල්ලුම් පත් ප්‍රමානයක් අතුරෙන් පිළිගෙන ඇත.

ඉරාකයේ දීම, අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන් සිය දහස් ගනනක් තම පන නල රැක ගැනුම සිය ඥාතීන් මත හෝ පුනාායතන ජාලයන් මත හෝ රදවා ඇත.

සිරියාවට හා ජෝර්දානයට මායිම් ව ඇති, ඒ සමගම වාඩිලා ගැනීමට විරුද්ධ කැරලි වලට කේන්ද්‍රස්ථානයක් වන අන්බාර් හි සුන්නි අරාබි බහුතරයක් වෙසෙන පලාතෙහි 80,000කට ආසන්න අවතැන් වූවන් සිටී. බොහෝමයක් අවතැන් වූවන් ගේ නිවෙස් රමාඩි හා ෆලූජා වැනි නගර වල එක්සත් ජනපද විරෝදී සටන්කාමීන් මර්ධනය කිරීමේ මෙහෙයුම් වලදී එක්සත් ජනපද මිලිටරිය විසින් විනාශ කර දමා ඇත. අනෙක් අය, එක්සත් ජනපද ගැති ආන්ඩුවේ ප්‍රධාන බලවේගයන් වන ෂියා පක්ෂ වලට හිතවත් මිලීෂියාවන් හා ආරක්ෂක බලකායන් මධ්‍යයේ කල්ලිවාදී හිංසනයෙන් බේරී ගැනීමට තැත් දරන බැග්ඩෑගය හා අනෙකුත් ප්‍රදේශ වලින් එන සුන්නි ජාතිකයෝ වෙති. බැග්ඩෑගයේ දීම පමනක් 50,000ක් පමන මෙලෙසින් අවතැන් ව ඇත.

බැග්ඩෑගයෙහි අවතැන් වූ සුන්නි ජාතිකයෙක් වන මොහොමඩ් රුබේ ලොස් ඇංජලීස් ටයිම්ස් පුවත්පතට මේ මාසයේදී පැවසුයේ ඔහු ඉදිරියට "කලු ඇඳුමින් සැරසුනු තුවක්කු කරුවන් දෙදෙනෙකු පොලීසියේ අනුබලයද ඇතිව" පැමිනුන බවයි. ඔවුන් පැවසුවේ "සුන්නින් දැන් පිටව යා යුතුයි. උඹලට ලැබෙන අවසාන අනතුරු ඇගවීම මෙයයි. අපි උඹලගෙ ගෙවල් එකින් එක ගිනි තියනවා." "අපේ අසල්වැසියා ගේ නිවස ගිනි තිබ්බහම පිටවෙන්න වෙලාව හරි බව මට හැගුනා."

ෂියා වරුන් විශාල සංඛ්‍යාවක් සුන්නි වරුන්ගේ එවැනිම කෲර සැහැසි කම් වලින් මිදීමට ෂියා ජනගහනය බලවත් ඉරාකයේ දකුනු දිග පලාත් වෙත පලා ගොස් ඇත. පසුගිය වසරේ පමනක් 40,000කට ආසන්න ප්‍රමානයක් කර්බාලා වෙත පැමිනියහ. අනෙක් දකුනු දිග පලාත් වල නවාතැන් සහ පිහිට බලාපොරොත්තු වන අවතැන් වූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව 10 ගුනයකින් වැඩි වීමක් පෙන්නුම් කලේය.

බුෂ් පරිපාලනය විසින් මේ මාසයේදී යුද්ධය උග්‍ර කෙරුමට මුලපිරීම, බැග්ඩෑගයේ ප්‍රචන්ඩ ක්‍රියා අතිවිශාල ලෙස වැඩි වීමටද හේතු වූයේ, නියත වශයෙන්ම තව තවත් ඉරාකීයයන්ට පලා යාමට බල කෙරෙනු ද ඇත. UNHCR, ඒ තතු කෙසේ වෙතත්, යන්තම් ඇමරිකානු ඩොලර් මිලියන 60ක් සහ සීමිත කාර්යමන්ඩලයක් පමනක් සහිතව දැනටමත් ඔඩුදුවා ඇති අර්බුදයට ප්‍රතිචාර දැක්වීමට බලාපොරොත්තු වේ.

© www.wsws.org